**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - 2023**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි  හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි  සැලැසුම්  කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්  සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල ශුද්ධ පොත් අගය රු. මිලියන 451.02 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල එය රු. මිලියන 449.54 ක් ලෙස නැවත ප්‍රකාශ කොට තිබුණි. කෙසේ වෙතත්, ඊට අදාල ගිණුම්කරණ සටහන් අංක 10 අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය පිරිවැය රු. මිලියන 660.99 ක් ලෙසත් සමුච්චිත ක්ෂය වටිනාකම රු. මිලියන 112.54 ක් ලෙසත් දක්වා තිබූයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි 29 සහ 53 ජේදයන් ප්‍රකාරව සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ බව නිරීක්ෂණය විය. | අධිකාරිය සතුව එක් එක් වත්කම් කාණ්ඩය යටතේ ලෙජරයෙහි පැවැති ශේෂය සඳහා මිලදී ගත් පිරිවැය හා වත්කමෙහි භෞතික තත්ත්වය පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් පරිදි නොතිබීම මත සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරිමට නොහැකි විය. ඉදිරියේදී මේ සම්බන්ධ නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමු. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 | | |
| | (i) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් යටතේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී ලැබිය යුතු ගිණුම් ශේෂයන් අඩුවීමෙන් වූ රු. මිලියන 26.14 ක මුදල් ගලා ඒම ගලපා නොතිබූ අතර අනෙකුත් ජංගම වත්කම්හි වැඩිවීමෙන් වූ මුදල් ගලා යාම රු.මිලියන 2.13 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේ දී සමස්ථ ජංගම වත්කම් වල වෙනස්වීම් ගැලපීමට කටයුතු කරන ලදි. එනම් සමස්ථ ජංගම වත්කම් වල වැඩිවීම (ලැබිය යුතු පොලිය හැර) මුදල් ගලායාම රු. මිලියන 148.07 මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත්වල හා භාණ්ඩාගාර බැදුම්කරවල පිළිවෙලින් රු.මිලියන 5.54 ක් හා රු. මිලියන 20.18 ක් ආයෝජනය කර තිබුණද එම අගයන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේදී අධිකාරිය විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලද මුදල රු. මිලියන 104.09 ක් වන අතර, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා 2023 වර්ෂයේ දී එකතු කරන ලද වටිනාකම රු. මිලියන 1.91 ක මුදලකි. එබැවින් එහි මුලු වටිනාකම රු. මිලියන 106 ක ආයෝජන වටිනාකම නිවැරදිව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 1.033 ක් වටිනා දේපළ,පිරියත හා උපකරණ අත්පත් කර ගෙන තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාම් ලෙස රු.මිලියන 72.13 ක් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කළ රු. මිලියන 66.54 ක කෙරීගෙන යන වැඩ ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේදී ශේෂ පත්‍රය හා එයට අදාල සටහන්වලට අගයන් සම්බන්ධ කිරීමෙන් මෙය සිදු වී ඇත. එනමුත් මෙමගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහයට බලපෑමක් වී නොමැති බව විශ්වාස කරමු. එමෙන්ම විගණනයේ නිරීක්ෂණය පරිදි 2024 මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී මෙය නිවැරදි කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

| | | |
|---|---|---|
| (i) නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු. මිලියන 85.9 ක් වූ සුළං මිනුම් කුළුණු 12 ක් සහ ඉන්වර්ටර් 2 ක් පොත්වලින් ඉවත් කර තිබුණද ප්‍රමිතයෙහි 81 ඡේදය ප්‍රකාරව ඉන් ඇති වූ වාසිය හෝ අවාසිය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණි. | මෙම ඉන්වර්ටර් නැවත අලුත්වැඩියා කර ප්‍රදර්ශන භාණ්ඩයක් ලෙස හෝ අධ්‍යාන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. සුළං කුළුණු 2012 වර්ෂයේ දී අපහරණය කර තිබූ අතර, සුළං කුළුණුවල ඓතිහාසික පිරිවැය හා අදාල අනෙකුත් තොරතුරු නිවැරදිව සොයාගැනීමට අපහසු වූ බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කිරීමට අපහසු වූ බැවින්, මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් එළිදරවු කිරීමට කටයුතු කරන ලදි. 2020 ජනවාරි මාසයේ අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් පත්කරන ලද අභ්‍යන්තර විශේෂඥ කමිටුවේ නිර්දේශ මත සුලං කුළුණු 4ක් ඉවත් කිරිමට නිර්දේශ කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව වත්කම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) ප්‍රමිතයේ 14 ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවයන් අස්ථිත්වය වෙත ගලාඒමේ භව්‍යතාවයක් ඇති විට අදාල පිරිවැය වත්කමක් ලෙස හඳුනාගත යුතු වුවත් එවැනි භව්‍යතාවයක් නොමැති සියඹලාන්ඩුව සූර්යබල ව්‍යාපෘතිය වෙනුවෙන් පවරාගැනීමට යෝජිත ඉඩමේ මායිම් කණු සිටුවීම වෙනුවෙන් දරා තිබුණු රු.මිලියන 1.03 ක වියදමක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සියඹලාණ්ඩුව ඉඩම අධිකාරියට නීත්‍යානුකූලව බදු අයිතිය පැවරීම සඳහා අවශ්‍ය කටයුතු අවසන් වී තිබෙන අතර, අධිකාරිය විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මූලික කටයුතු වෙනුවෙන් බදු මුදල් 2023 වර්ෂයේ දී ගෙවන ලදී. කෙටුම්පත් බදු ගිවිසුම නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර, අනුමැතිය ලද වහාම බදු ගිවිසුම අත්සන් කිරීමට නියමිතයි. එබැවින් මෙම මායිම් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කණු සිටුවීම මගින් වත්කම් හඳුනාගැනීම හා අනිකුත් කාර්යයන් සඳහා දායකත්වයක් ලබාදෙන බැවින් මායිම් කණු සිටුවීම සඳහා දරන ලද පිරිවැය ප්‍රාග්ධනිත කරන ලදී. | |
| | (iii) ප්‍රමිතයේ 42 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කළ දින සිට ඉදිරියට සමුච්චිත ක්ෂය වීම් ගණනය කළ යුතු වුවත් 2023 අගෝස්තු 31 සහ දෙසැම්බර් 31 දින සිදුකර තිබුණු වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකම් මත 2023 සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කර රු. මිලියන 112.54 ක් ක්ෂය ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. | සුනිත්‍ය බලශක්ති අධිකාරිය අනුගමනය කරනු ලබන්නේ වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා සම්පූර්ණ ක්ෂය ගැලපීමටත් ඉවත් කරන වර්ෂයේ දී ක්ෂය ගැලපීම් නොකිරීමටත්ය. මෙම වත්කම් ප්‍රත්‍යාගණන කාලසීමාව ප්‍රමාද වුවද මෙම සියලු වත්කම් 2022 වර්ෂයට පෙර මිලදී ගත් වත්කම් වන අතර, බොහෝ වත්කම් පූර්ණ ලෙස ක්ෂය ගණනය කරන ලද වත්කම්ද වේ. එබැවින් මෙම වත්කම් මුලු වර්ෂය පුරාවටම අධිකාරිය මගින් භාවිතා කර ඇති බැවින් මුලු වර්ෂය සඳහාම ක්ෂය ගැලපීමෙන් මූල්‍ය ප්‍රකාශන වෙත ප්‍රමාණාත්මක බලපෑමක් සිදු නොවී ඇති බැවින් වඩා ඵලදායි අගයක් නිරූපණය කරනු ලබන බවත්, අප විශ්වාස කරමු. අධිකාරිය සතුව වත්කම් වල පූර්ව වර්ෂවල තොරතුරු නොමැති බැවින් පවත්නා තොරතුරු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (iv) 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 259,095 ක් වූ අක්‍රීය උපකරණ අයිතම 266 ක් සම්බන්ධයෙන් ප්‍රමිතයේ 79 ඡේදය ප්‍රකාරව කිසිදු වෙන් කිරීමක් සිදු කොට නොතිබූ අතර 86 හා 91 ඡේදයන් ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | විගණනයේ නිර්දේශ පරිදි ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී මෙම තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1979 අංක 08 දරන රජයේ ඉඩම් අත්පත්කරගැනීමේ පනත යටතේ 2017 වර්ෂයේදී අධිකාරිය විසින් අත්කරගෙන තිබුණු 2020 වර්ෂයේදී රු. මිලියන 7.8 කට පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු හෙක්ටයාර් 0.62 ක අවිස්සාවේල්ල පිහිටි ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 13 ප්‍රකාරව ආයෝජන දේපළ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ඉඩම් පනතේ 6.1 සම්පූර්ණ කළ පසු ඉඩමේ නීත්‍යානුකූල ලිපිලේඛන සුනිත්‍ය බලශක්ති අධිකාරියට ලැබෙන අතර, ඉන්පසු තක්සේරු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමෙන් පසුව පොත්වල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ ප්‍රමිතියෙහි 76 ඡේදය ප්‍රකාරව පාරිතෝෂික වෙන්කිරීම ආයුගණක තක්සේරු ක්‍රමය භාවිතා කර ගණනය කර නොතිබුණු අතර ප්‍රමිතියේ 141 වගන්තිය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර | සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක19 හි (SLPSAS – 19) 76 වන ඡේදය ප්‍රකාරව නියමිත ක්‍රමයට විශ්‍රාම ප්‍රතිලාභ වල වටිනාකම ගණනය කිරීම ඒ පිළිබඳව මනා පළපුරුද්දක් ඇති පාර්ශවයන් විසින් කළ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| නොතිබුණි. තවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව පාරිතෝෂික වෙන්කිරීම රු. මිලියන 40.7 ක් වූ අතර උපලේඛනය අනුව රු. මිලියන 40.4 ක් වූයෙන් රු. 340,821 ක වෙනසක් නිරීක්ෂණය විය. | යුතු අතර, එවැනි ආයතන 2 ක් පිළිබඳව තොරතුරු ලබාගත හැකි වුවත්, ඔවුන් කිසිවකු මිල ගණන් ඉදිරිපත් නොකළ බැවින් පූර්ව වර්ෂයේ ප්‍රතිලාභ ගණනය කළ ආකාරයට ගණනය කරන ලදි. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රත්‍යගණනය නොකල ගොඩනැගිලිවල ආරම්භක පිරිවැය ලෙස ඉකුත් වර්ෂයේ ශුද්ධ අගය වූ රු. මිලියන 86.28 ක් මත සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ගොඩනැගිලි ශුද්ධ වටිනාකම රු. මිලියන 3.75 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම් ප්‍රත්‍යාගණනය ගිණුම්ගත කිරීමේදී වැරදීමකින් මෙය සිදු වී ඇති අතර, මේ පිළිබඳ ගිණුම්කරණ කටයුතු නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදෙන ලදී. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිරි ගිණුම් වර්ෂයේදී අතීතානුයෝගීව නිවැරදි කළ යුතුය. |
| (ආ) | සියඹලාන්ඩුව ව්‍යාපෘතියේ නැවත වන වගා සඳහා ඉකුත් වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු රු. මිලියන 12.78 ක අත්තිකාරම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීමේ දෝෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර තිබුණු අතර අත්තිකාරම වැය කල අකාරය පිළිබඳ තොරතුරු ලබා නොගෙන සම්පූර්ණ වටිනාකම වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අධිකාරිය මෙහිදී ක්‍රියාත්මක වන්නේ ව්‍යාපෘති සංවර්ධකයාගේ ක්‍රියාවලියට සමාන ක්‍රියාවලියකිනි. මෙහිදී ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමේ අරමුණ ඇතිව වන වගා කටයුතු සඳහා රු. මිලියන 12.78 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. මෙම මුදල වන වගා සඳහා ලබාදුන් දායකත්ව මුදලකි. ව්‍යාපෘතියකට ඍජුව සම්බන්ධ නොවන දායකත්ව මුදල් (ප්‍රාග්ධනික කළ නොහැකි) එම වියදම දරන ලද වර්ෂයේ ආදායමට එරෙහිව ගැලපිය යුතු බැවින් එය 2022 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කරන ලදී. | වියදම් කල මුදල් වලට අදාල කල වැඩ විස්තර ලබාගෙන ඒ අනුව වියදම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.මිලියන 25.45 ක බැරකම් අයිතම 2 කට හා රු. මිලියන 2.8 ක වත්කම් අයිතමයකට අදාල විස්තරාත්මක උපලේඛණ, බිල්පත්, ශේෂ සනාථකිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි. | උපචිත වියදම් හා රඳවාගත් මුදල් සඳහා විස්තරාත්මක උපලේඛණ විගණනය වෙත ලබාදීමට කටයුතු කරන අතර, NAMA ව්‍යාපෘතියේ අදාල වියදම් වාර්තා අධිකාරිය වෙත ලැබීමට සලස්වන මෙන් දකුණු පළාත් සභාවට ලිපි යොමු කර ඇත. එහි පිටපත් විගණනය වෙත ලබාදීමට කටයුතු කරමි. | අදාල සාක්ෂි කඩිනමින් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුඩා ජල විදුලි ව්‍යාපෘති 19 ක ආයෝජකයින් විසින් ඉඩම් අත්පත් කරගැනීමට ලබාදුන් මුදලින් ඉතිරි රු. මිලියන 5.6 ක් ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ඉන් වර්ෂ 05 ඉක්මවූ නිරවුල් නොකල ශේෂය රු. මිලියන 4.2 ක් විය. ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු කඩිනමින් නිමකර ආයෝජකයින් වෙත ලබා නොදීම මේ සඳහා හේතු වී තිබුණි. | අධිකාරිය සතුව ඉඩම් සම්බන්ධ කටයුතු සිදුකිරීමට සිටිනුයේ එක් නිලධාරියෙකු පමණි. මේ දිනවල ක්‍රියාත්මක වන සියඹලාණ්ඩුව, පුනරීන් හා මන්නාරම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන් සඳහා ඔහු බොහෝ කාර්යබහුල වී තිබිණ. මේ සඳහා ඉදිරියේ දී අධිකාරියට අනුමත කාර්යමණ්ඩල සංඛ්‍යාව නැවත ප්‍රතිස්ථාපනය කර ඉඩම් ගැටලුව ඉතා ඉක්මනින් නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | අදාල මුදල් ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු සඳහා භාවිතා කර ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් කඩිනමින් ලබාගෙන ආයෝජකයින් වෙත බදු දිය යුතුය. |

## 1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත | | | |
| (i) | 3 වගන්තිය | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය නිල බලයෙන් පත්වන සාමාජිකයින් 12 කින් සහ අමාත්‍යවරයා විසින් පත්කල යුතු සාමාජිකයින් 9 දෙනෙකුගෙන් සැදුම්ලත් සාමාජිකයින් 21 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් 2024 මාර්තු 31 දින වන විටත් ඉන් අමාත්‍යවරයා විසින් පත්කල යුතු එක් සාමාජිකයෙක් පත්කර නොතිබුණි. | සභාපතිතුමාගේ 2024.05.16 දිනැති ලිපිය මගින් ගරු අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් මේ දක්වා එකී පත් කිරීම සිදු කර නැත. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් | අක්‍රිය වී තිබුණු රු. මිලියන 20 ක් වටිනා ඉන්වර්ටර් දෙකක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අක්‍රිය වී ඇති ඉන්වර්ටර් නැවත අලුත්වැඩියා කිරීමට ඇති හැකියාව සොයා බලමින් පවතී.එය ප්‍රදර්ශන භාණ්ඩයක් ලෙස හෝ අධ්‍යාන කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලිසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 104 හා 110 | | | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 | | | |
| (i) | 11 ඡේදය | අධිකාරියේ 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2024 අගෝස්තු වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අවසන් අදියරයේ පවතින අතර, 2024/08/31 දින වන විට අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ii) | 15.1 ඡේදයේ සඳහන් මු.රෙ 877 (1) (ඇ) (ඈ) සහ 877 (2) (ඇ) වගන්තීන් | අධිකාරිය යටතේ පවතින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල සහ සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල සඳහා 2021, 2022, 2023 සහ 2024 වර්ෂ සඳහා අයවැය ලේඛන සකස් කර නොතිබුණු අතර අරමුදල්වල ලැබීම් සහ ගෙවීම් ගිණුම් තැබීම, කාර්තුමය වාර්තා සහ අවසන් ගිණුම් සකස්කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ සහ ආකෘති ප්‍රකාරව සිදුකර නොතිබුණි. | මෙම අරමුදල් භාවිතා කිරීමේ ක්‍රමවේද නිසියාකාරව නිම වී නොමැති අතර, ඉදිරියේදී අරමුදල් භාවිතාවට ගැනීමේ දී ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියා කරමි. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 | | | |
| (i) | රාජ්‍ය ව්‍යවසායන්හි සංයුක්ත පාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදය සහ ඇමුණුම 01 හි 1 ඡේදය | අධිකාරියේ විවිධ ක්ෂේත්‍රයන්හි පවතින අවදානම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර නොතිබුණු අතර අධිකාරිය විසින් උපායමාර්ගික සැලැස්මට අනුකූලව පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සකස් කර නොතිබුණි. | කමිටුව කඩිනමින් පත් කිරීමට බලාපොරොත්තු වේ. අධිකාරිය සතුව පවතින උග්‍ර සේවක ඌනතාවය මත, මූල්‍ය අංශයේ දෛනික කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ ද ඉතාමත් අපහසුතාවයක් යටතේ ය. ඉදිරියේ දී මේ සඳහා සේවකයින් අනුයුක්ත කොට ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගනිමි. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති තුමා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමි. | චක්‍ර ලේඛ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඉ) | 2019 අගෝස්තු 9 දිනැති අංක 2135/61 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග සංග්‍රහයේ අංක 4 හි සඳහන් කාලරාමුව | අධිකාරිය වෙත නෛතිකව වගකීම පවරා දී තිබූ කාර්යයන් 10 ක් සම්බන්ධයෙන් අධිකාරිය විසින් කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණි. | මෙම බලශක්ති ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයක් වූ 2030 දී සියයට 70 ක් වූ පුනර්ජනනීය බලශක්තිය ප්‍රධාන පද්ධතියට සම්බන්ධීකරණය සඳහා වූ ප්‍රතිපත්තියට සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සහය දෙන ලදී.එහිදී ඉඩම් මැනීමේ කාර්යයන් සහ අනෙකුත් කටයුතු වලට මැදිහත් වීම නිසා ඒ වෙනුවෙන් විශාල පරිශ්‍රමයක් දැරීමට සිදු විය.තවද බලපොරොත්තු වූ පරිදි ආසියානු බැංකුව, ලෝක බැංකුව යන ආයතන වලින් ලැබීමට නියමිතව තිබූ මුදල් නොලැබුන නිසා (IMF Condition) මෙමෙ ක්‍රියාවන් කරගෙන යාමට නොහැකි විය.නමුත් අවස්ථානුකූලව හැකි සියලු ව්‍යාපෘති දැනටමත් පටන් ගෙන ඇත. | ජාතික බලශක්ති ප්‍රතිපත්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පළමු කොටසෙහි පරිච්ඡේද (ii) හි 6 වන හා 7 වන ඡේදයන් ප්‍රකාරව අධිකාරිය විසින් බද්දට යටත් වන අදායම් හා ආයෝජන ආදායම් ඉපයූවද,එම පනතේ 126 (i) ඡේදය ප්‍රකාරව බදු වාර්තා ඉදිරිපත් කොට එම පනතේ 145 වන ඡේදය ප්‍රකාරව බදු ගෙවීම් සිදු කර නොතිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2022 හා 2023 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 105.54 ක හා රු.මිලියන 88.08 ක අතිරික්තයක්ද රු.මිලියන 34.8 ක හා රු.මිලියන 175 ක ආයෝජන ආදායම්ද උපයා තිබුණද අදායම් බදු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් හෝ සිදු කර තිබුණි. තවද එම පනතේ 93(1) වගන්තිය සහ 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 113(1) වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2023 | සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මහා භාණ්ඩාගාරය මත යැපෙන අධිකාරියක් බැවින් හා මහා භාණ්ඩාගාරය මගින් ලැබෙන ප්‍රතිපාදන අඩු කළ විට අලාභයක් පවතින බැවින් බදු ප්‍රතිපාදන නොකළ මුත් විගණන විමසුම් පරිදි ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ආදායම් බදු ගෙවීමට අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. ආදායම් බදු සඳහා ලියාපදිංචි වූයේ 2024 වර්ෂයේ දී බැවින් ඉලෙක්ට්‍රොනික ආදායම් බදු වාර්තා අප වෙත නිකුත් කරන මෙන් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. ඉදිරියේ දී ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට කටයුතු කර ඇත. | බදු රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

නොවැම්බර් 30 දක්වා ආදායම් වාර්තා ගොනු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 88.1 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 105.5 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 17.4 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී බලශක්ති අරමුදල් ආදායම රු. මිලියන 75.1 කින් පහළ යාම හා වර්ෂයට අදාල ක්ෂය වියදම රු මිලියන 61 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන විෂයයන්වල විචලතා විශ්ලේෂණය

පෙර වසර තුන (03) හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රධාන විෂයන් වල වැඩි වීම හෝ අඩු වීම සහ එම වැඩි වීමේ හෝ අඩු වීමේ ප්‍රතිශතය විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | 2023 | 2022 | 2021 | 2020 | අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම (රු.මි)** | **228** | **217** | **415** | **295** | මෙහෙයුම් අදායම අඩුම අගය 2022 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර 2021 වර්ෂයේදී ලබා දී තිබුණු භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන 2022 වර්ෂයේදී විශාල වශයෙන් අඩුකර තිබීම මේ සඳහා හේතු වී ඇත. |
| විචලනය (රු.මි) | 11 | (198) | 120 | 14 | |
| වැඩිවීම/(අඩුවීම) (%) | 5 | -48 | 41 | 5 | |
| **මෙහෙයුම් නොවන ආදායම(රු.මි)** | **278** | **340** | **61** | **41** | 2022 වර්ෂයේදී සුනිත්‍ය බලශක්ති අරමුදලේ මුදල් ආයෝජනය කිරීම නිසා එම වර්ෂයේ සිට මෙහෙයුම් නොවන ආදායම් විශාල වශයෙන් ඉහළ ගොස් තිබුණු අතර 2022ට සාපේක්ෂව 2023 වර්ෂයේදී බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් ලද අයදුම්පත් ගාස්තු ආදායම අඩු වී තිබුණි. |
| විචලනය (රු.මි) | (62) | 279 | 20 | (45) | |
| වැඩිවීම/(අඩුවීම) (%) | -18 | 457 | 49 | -52 | |
| **ව්‍යාපෘති වියදම් (රු.මි)** | **98** | **200** | **64** | **59** | 2022 වර්ෂයේදී අධිකාරිය විසින් මහාපරිමාණ සූර්යබල උද්‍යාන ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් වෙනුවෙන් විශාල වශයෙන් වියදම් දරා තිබුණි. |
| විචලනය (රු.මි) | 102 | 136 | 5 | (41) | |
| වැඩිවීම/(අඩුවීම) (%) | 51 | 212 | 8 | -41 | |
| **පුනරාවර්තන වියදම් (රු.මි)** | **320** | **251** | **231** | **234** | 2023 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම හේතුවෙන් ක්ෂය වියදම ඉහළ යාම පුනරාවර්තන වියදම් වැඩි වීම සඳහා හේතු වී තිබුණි. |
| විචලනය (රු.මි) | 69 | 20 | (3) | 14 | |
| වැඩිවීම/(අඩුවීම) (%) | 27 | 9 | -1 | 6 | |
| **ආයෝජන (රු.මි)** | **633** | **522** | **68** | **112** | සුනිත්‍ය බලශක්ති අරමුදලේ මුදල් අඛණ්ඩව ආයෝජනය කිරීම ආයෝජන ඉහළ යාමට හේතු වී තිබුණි. |
| විචලනය (රු.මි) | 111 | 454 | (44) | 10 | |
| වැඩිවීම/(අඩුවීම) (%) | 21 | 668 | -39 | 10 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **මුදල් හා මුදල් සමාන දෑ (රු.මි)** | **723** | **201** | **587** | **460** | නිසි ආයෝජන සැලැස්මක් හා මූල්‍ය පුරෝකථනයක් නොමැතිව කෙටි කාලීන තැන්පතු වල මුදල් ආයෝජනය කිරීම මේ සඳහා හේතු වී තිබුණි. |
| විචලනය (රු.මි) | 522 | (386) | 127 | 23 | |
| වැඩිවීම/(අඩුවීම) (%) | 260 | -66 | 28 | 5 | |

**2.3 අනුපාත විශ්ලේෂණය**

| **අනුපාතය** | **2023** | **2022** | **2021** | **2020** | **2019** |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය (වාර) | 3.33 | 8.51 | 21.63 | 21.07 | 13.58 |
| මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය(%) | 3.51 | 6.45 | 13.26 | 3.54 | 3.79 |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය ( %) | 4.16 | 6.84 | 13.95 | 3.71 | 3.96 |
| ශුද්ධ අතිරික්ත(ලාභ) අනුපාතය (%) | 38.6 | 48.38 | 43.85 | 14.57 | 16.37 |
| වත්කම් පිරිවැටුම් අනුපාතය ( වාර) | 0.09 | 0.13 | 0.30 | 0.24 | 0.23 |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2007-2009 වර්ෂවල විදුලි වාහන ආකෘති 3 ක් නිෂ්පාදනය සඳහා අධිකාරිය විසින් පුද්ගලික සමාගමක් වෙත රු.මිලියන 7.8 ක මුදලක් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 07 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය ප්‍රකාරව 2013 ජනවාරි 4 දින විගණකාධිපතිගේ ප්‍රධානත්වයෙන් රැස් වී තිබුණු කමිටුවේදී මෙම කාර්යයට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, මේ සම්බන්ධ සත්‍ය තත්ත්වය ප්‍රධාන ගණන්දීමේ නිලධාරී මඟින් පොදු ව්‍යාපාර කාරක සභාව වෙත දැනුම් දීමටත් තීරණය කර තිබුණි. කෙසේ නමුත්, මීට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගෙන නොතිබුණි. තවද අධිකාරිය විසින් අදාල පෞද්ගලික සමාගමට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට කල් ඉකුත් වී තිබූ ගිවිසුමේ 19 කොන්දේසිය ප්‍රකාරව බේරුම්කරණ ක්‍රියාවලියකට පිවිස තිබුණි. එහිදී විදුලි වාහන ආකෘති 3 වෙනුවට එක් ආකෘතියක් පමණක් ලබාගැනීමට තීරණය කර | මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශනයක් සිදු කර වගකිව යුතු නිලධාරීන්ට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බවට 2024.07.02 අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණය වූ අතර ඒ සඳහා සුදුසු කමිටුවක් පත් කිරීමට පියවර ගෙන ඇති අතර කමිටු වාර්තාව ඉදිරියේදී විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | කමිටු නියෝග ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයට පාඩු නොවන පරිදි අදාල කටයුතු ඉටු කරවා ගත යුතුය. |

බෙරුම්කරණ ක්‍රියාවලිය අවසන් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එක් විදුලි වාහන ආකෘතියක් හෝ අධිකාරිය වෙත ලබාගෙන නොතිබුණි.

## 3.2 කලමනාකරණ හා මෙහෙයුම් කටයුතු

### (අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ සඳහන් කාර්යයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ලංකා විදුලි බල මණ්ඩලයේ මධ්‍යම ජාලයේ පවතින ධාරිතාවය ( Available Grid Capacity ) ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට විසඳුම් ලෙස අධිකාරිය පනතේ 5 (ඇ) වගන්තිය ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර වූ ( off grid ) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදුකල යුතු වුවත් අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් පනතේ 25 (අ) වගන්තිය ප්‍රකාරව 2024 ජුලි වන විටත් මධ්‍යම ජාලයෙන් බැහැර කිසිදු පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සඳහා බලශක්ති බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | 2021 වන විට ජාතික විදුලිබල පද්ධතියට දිගු කළ ප්‍රතිශතය සියයට 98 දක්වා වර්ධනය වී ඇති බැවින් ජාතික පද්ධතියෙන් බැහැරව විදුලිය ලබාදිය නොහැකි සියයට 2 ප්‍රතිශතයක් සඳහා විදුලිය ලබාදීමට අවශ්‍ය පියවර භූමිය පිහිටීම හා තත්ත්වය අනුව ගැනීමට බලශක්ති අධිකාරිය පියවර ගෙන ඇත.මැද කැලේ ,උඩගල දෙබොක්ක ,ගල මුදුන වැනි ප්‍රදේශ ජාතික පද්ධතිය දිගු කළ නොහැකි ස්ථාන හඳුනාගෙන විදුලිය ලබාදීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. තාක්ෂණය දියුණු වීමත් සමග මධ්‍යම ජාලයෙන් බැහැර වූ විදුලි අවශ්‍යතාවයක් ඇති කණ්ඩායම් වෙතොත් ඒ අය සඳහා එම අයගේ අවශ්‍යතාවය මත පෞද්ගලික විදුලිය ලබා ගැනීමේ ක්‍රමවේද ඇත. ඒවාට අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේද අත්පොත් සහ ප්‍රමිතීන් සකස් කිරීම, මෙවැනි කට්ටල ස්ථාපිත කිරීම සඳහා පුහුණු කරන ලද පිරිස අධිකාරිය මගින් නිරන්තරයෙන් බිහිකිරීම් හා අවශ්‍ය මාර්ගෝපදේශයන් සකස් කර ඇත.එය ඉදිරියේදී නීති කෙටුම්පත් සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධි විධාන ප්‍රකාරව මධ්‍යම ජාලයෙන් බැහැර පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති දිරිමත් සහ ප්‍රවර්ධනය කළ යුතුය. |
| (ii) | පනතේ 8 වගන්තිය අනුව එක් එක් ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති සම්පත් විභවතාවය අනුව පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගැසට් පත්‍රයේ පල කළ යුතු වුවත් අධිකාරිය පිහිටුවා වසර 16 ක් ගත වී තිබුණද 2024 ජුලි වන විටත් එවැනි සැලැස්මක් ගැසට් කර නොතිබුණි. | 2020 වසර තුලදී සකස් කරන ලද පුනර්ජනනීය බලශක්ති සැලස්ම, 2021 ජුලි 21 දින මහජන අදහස් ලබා ගැනීමෙන් පසු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2021 නොවැම්බර් 26 දින සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී. අනතුරුව 2024 පෙබරවාරි 27 දින කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විදුලිබල අමාත්‍යවරයා විසින් සංශෝධිත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන බවට දන්වා සිටින ලදී. මේ අනුව ලේකම්තුමාගේ උපදෙස් අනුව | පනතේ විධි විධාන ප්‍රකාරව කඩිනමින් පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම ගැසට් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | (2024-2027) වර්ෂ සඳහා සකස් කරන ලද පුනර්ජනනිය බලශක්ති සැලැස්ම නැවත කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා 2024 මැයි 03 වන දින විදුලිබල අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. | |
| (iii) | පනතේ 19 (1) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රය ක්‍රියාත්මකව පවතින්නේ කවර කාලයක් තුලදීද එම කාලය තුලදී ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙනුවෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක් රාජ්‍ය භාගය ලෙස වාර්ෂිකව අධිකාරියට ගෙවීමට සංවර්ධනකරුවන් බැදී සිටිය යුතුය. නමුත් ඊට අදාල රාජ්‍ය භාගය අයකිරීමට අදාල ක්‍රමවේදය මේ දක්වා තීරණය කර නොතිබීම හේතුවෙන් අදාල රාජ්‍ය භාගය අයකිරීමට අධිකාරියට නොහැකි වී තිබුණි. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත වසර 2007 සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම පාහේ මෙම රාජ්‍ය භාගය අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ඡා කොට ඇත. විවිධ අවස්ථා ගණනාවක දී මෙම අයකිරීම් සඳහා අවශ්‍ය මුදල් අමාත්‍ය තුමන්ගේ එකඟතාව ලබාගැනීමට ද අධිකාරිය උත්සාහ දරා ඇත. ඒ අයුරින්ම මෙම සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකා ද පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. අමාත්‍යාංශය එකඟ වූ වහාම මෙම අයවීම් අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරනු ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව රාජ්‍ය භාගය අයකිරීම සඳහා වන ක්‍රියාමාර්ග කඩිනමින් ඉටු කළ යුතුය. |
| (iv) | පනතේ 45(1) වගන්තිය ප්‍රකාරව මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මගින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන සෙස් බද්දක් ආනයනය කරනු ලබන සියළුම පාශානිභූත ඉන්ධන නිෂ්පාදන මත පැනවීම, අයකිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු වුවද ඒ සඳහා ක්‍රමවේද සකස් නොකිරීම හේතුවෙන් අදාල ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත වසර 2007 සිට පත් වූ සෑම අමාත්‍යවරයකු සමගම පාහේ මෙම සෙස් බදු අයකර ගැනීම පිළිබඳව අධිකාරිය සාකච්ඡා කොට ඇත. විවිධ අවස්ථා ගණනාවක දී මෙම අයකිරීම් සඳහා අවශ්‍ය මුදල් අමාත්‍ය තුමන්ගේ එකඟතාව ලබාගැනීමට ද අධිකාරිය උත්සාහ දරා ඇත. ඒ අයුරින්ම මෙම සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගැනීමට කැබිනට් පත්‍රිකා ද පිළියෙළ කොට අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත. අමාත්‍යාංශය එකඟ වූ වහාම මෙම අයවීම් අධිකාරිය සතුකර ගැනීමට කටයුතු කරනු ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව සෙස් බද්ධ අයකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ඉටු කළ යුතුය. |
| (v) | පනතේ 61 (1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි සහ පරිශ්‍රවලට ඇතුළු වී සෝදිසි කිරීම, සමීක්ෂණය කිරීම, පරීක්ෂාකිරීම හෝ විමර්ෂණය කිරීම සඳහා මණ්ඩලයේ ලිඛිත අධිකාරි බලය සහිතව විශේෂ නිලධාරීන් පත්කර නොතිබුණි. | බලශක්ති පිල් ලකුණු පිළිබඳ රෙගුලාසියට අනුව, බලශක්ති තොරතුරු වාර්තා කිරීමට යම් ආයතනයක් අසමත් වූ අවස්ථාවක හෝ බලශක්ති පිල් ලකුණ අනුගමනය කරනු ලබන බවට සහතික වීම සඳහා යම් ආයතන පරිශ්‍රයකට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීමට, තොරතුරු ලබා ගැනීමට, තොරතුරු තහවුරු කිරීමට හෝ යම් පරීක්ෂාවකට අධිකාරිය විසින් විධිමත් ලෙස ප්‍රතීතනය කරනු ලැබූ බලශක්ති කළමනාකරුවෙකුට හෝ | පනතේ විධි විධාන ප්‍රකාරව බලශක්ති අකාර්යක්ෂම ස්ථාන පිළිබඳ කටයුතු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | | බලශක්ති සේවා සපයන්නෙකුට බලය ලබා දී ඇත.ඒ අනුව මේ නියමයන් බලපාන යම් පරිශ්‍රයන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා නොදෙන අවස්ථාවක ඒ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාවලි ක්‍රියාත්මක වීම සඳහා සූදානම් කොට ඇත. | |
| (vi) | පනතේ 47(1) සහ 67 වගන්ති ප්‍රකාරව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ව්‍යාපෘති සඳහා ණය ඉල්ලුම්කරන ආයෝජකයින් සඳහා අවශ්‍ය ඇප ලබාදීමේ අරමුණින් පිහිටුවා තිබුණු සුනිත්‍ය බලශක්ති ඇප අරමුදලේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් සකස් කල යුතු රෙගුලාසි සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවීම සඳහා වන කෙටුම්පත් සකසා අවසන් කර ඇති අතර, එය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vii) | පනතේ 46 (3) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල මඟින් සිදු කල යුතු කාර්යයන් වූ තෝරාගත් නැවත බලගැන්විය හැකි බලශක්ති මත පදනම් වූ බලශක්ති පරිවර්තන පිරියත සඳහා වූ සහනාධාර සැපයීම, බලශක්ති කාර්යක්ෂම උපකරණ සහ තාක්ෂණය භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සහනාධාර සැපයීම, කාර්මික තාප අධික යෙදවුම් ඇතුළු ඉන්ධනවලට හැරවීම සඳහා වූ ප්‍රාග්ධන සහනාධාර සැපයීම සහ බලශක්ති සංරක්ෂණ පියවර යොදාගැනීම දිරිමත් කිරීම සඳහා සහ රටේ සියලු ප්‍රදේශවල ග්‍රාමීය බලශක්ති සේවා දියුණු කිරීම සඳහා යම් සමිතියකට හෝ ප්‍රජාපාදක සංවිධානවලට දිරිදීමනා හෝ වෙනත් සමාන මූල්‍ය ආධාර ලබාදීම යන කාර්යයන් කිසිවක් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. | සුනිත්‍ය බලශක්ති අරමුදල පිහිටුවීමට අදාල මාර්ගෝපදේශ සැකසීම අවසන් කර ඇති අතර, එය කළමනාකරණ මණ්ඩල අනුමැතියට යොමු කරන ලදී. කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ හා යෝජනා ඇතුළත් කිරීමෙන් පසු මෙය ඉදිරියේ දී බලාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත.එසේම 2023 වර්ෂයේදී ආරම්භ කරන ලද පහත සඳහන් ව්‍යාපෘති 2024 වර්ෂයේදී නිම කිරීමට බලාපොරොත්තු වේ.<br>1.උස්සාන වාරිමාර්ග ව්‍යාපෘති 3 (2024 වර්ෂයේදී නිම කරන ලදී)<br>2.500 KW සූර්යබල ව්‍යාපෘතියක් හම්බන්තොට උද්‍යානය තුල ආරම්භ කරන ලදී.<br>3.ගලමුදුන ගම්මානයට විදුලිය ලබා දීම (නිම කර ඇත) | පනත මඟින් අනුමත කාර්යයන් සඳහා පමණක් අරමුදල භාවිතා කළ යුතුය. |
| (viii) | පනතේ 30 වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් කුඩා ජල විදුලි ව්‍යාපෘති 15 ක් සඳහා 1979 අංක 08 දරන රජයේ ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ හෙක්ටයාර් 14.13 ක් අත්පත්කර ගැනීමේ කටයුතු ආරම්භකර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් විධිමත්ව අත්පත්කරගෙන නොතිබුණි. එම නිසා පනතේ 32 වගන්තිය ප්‍රකාරව එම ඉඩම් බදු දීම හෝ භුක්තිය භාර දීම කර වාර්ෂිකව බදු මුදල් අයකිරීමට අධිකාරිය අපොහොසත් වී | අධිකාරිය විසින් භුක්තිය භාර ගන්නා ලද ඉඩම් කැබලි 45 න් ඉඩම් කැබලි 16 ක් නිවැරදිව බදු දී ඇති අතර ඉතිරි ඉඩම් කැබලි 29 පනතේ 9 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණ අවසන් කිරීමෙන් පසුව රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමෙන් පසු හිඟ බදු මුදල්ද සමඟ නියමිත බදු මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වමි. සිරිඔය ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු මෙතෙක් ආරම්භ වී නොමැති අතර බදු මුදල් ගෙවන | ඉඩම් අත්පත් කරගැනීම් කටයුතු කඩිනමින් අවසන් කර ඉඩම් බදු දී බදු මුදල් අය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. තවද බදු දුන් වෙනත් ඉඩමක් වෙනුවෙන් 2021 සිට 2024 මාර්තු දක්වා අය විය යුතු රු. මිලියන 1.3 ක බදු සහ ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ලෙසට අධිකාරිය අදාල ව්‍යාපෘති යෝජක දැනුවත් කර ඇත. | |
| (ආ) | පියසි මත සූර්යබල පද්ධති සම්බන්ධතා ලබාදීමට අවශ්‍ය ජාල නවීකරණයට රු. මිලියන 50 ක් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ඉකුත් වර්ෂයේදී ලබා දී තිබුණු අතර එම කාර්යයන්හි ප්‍රගතිය පසුවිපරම් කර නොතිබුණි. | මෙහි ප්‍රගතිය විමසීම සඳහා විදුලිබල මණ්ඩලය වෙත ලිපි යොමු කරන ලදී. එහෙත් එහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් අධිකාරිය වෙත නොලැබුණු අතර නැවත සිහිකැඳවීම් ද විදුලිබල මණ්ඩලය වෙත සිදු කරන ලදී. | අදාල කාර්යයන් සම්බන්ධ ප්‍රගතිය කාලීනව පසුවිපරම් කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මන්නාරම සහ පූනරින්හි මෙගාවොට් 500 ක ධාරිතාවයෙන් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ඉදිකිරීම විදේශීය පෞද්ගලික ආයෝජකයෙකු වෙත පිරිනැමීම සඳහා 2022 මාර්තු 15 දිනැති අංක අමප/22/0380/301/008 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණි. ඒ වන විට අධිකාරිය උක්ත ව්‍යාපෘතිවල සිදුකර තිබුණු මූලික සංවර්ධන කාර්යයන් වෙනුවෙන් දරා තිබුණු එ.ජ.ඩො. 747,733 ට සමාන රු.මිලියන 261.7 ක් ව්‍යාපෘති සංවර්ධකගෙන් 2022 නොවැම්බර් 08 දිනැති අංක රහිත ලිපිය මගින් ඉල්ලුම් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ව්‍යාපෘති සංවර්ධකගෙන් ලැබිය යුතු එ.ජ.ඩො 425,381 ට සමාන රු. මිලියන 112.5 ක් ලෙස එ.ජ.ඩො 322,352 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර තිබුණි. එම වටිනාකම් අඩුකිරීම් සඳහා ව්‍යාපෘති සංවර්ධක සමඟ ඇතිකරගත් එකඟතාවයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | එ ජ ඩො 425,381 සකස් වී ඇති ආකාරය මේ සමඟ ඉදිරිපත් කරමි. | වටිනාකම් අඩුකර ගැනීමට අදාල එකඟතාවයන් පිළිබඳ විස්තර නොපමාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අරමුණු ඉටුකරගැනීමට සෘජු දායකත්වයක් ලබා ගත හැකි නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ - (ඉංජිනේරු) අනුමත තනතුරු 48 න් තනතුරු 22 ක්ද තාක්ෂණික සහකාර අනුමත තනතුරු 17 න් 9 ක්ද 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. | අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය 2020 අගෝස්තු මස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලදී. රට තුල පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීම හේතුවෙන් බාහිර බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රමාද විය.කෙසේ වෙතත් 2021 මැයි මසදී ඉංජිනේරුවන් 16 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය මගින් තෝරා 2022 දී පත්වීම් ලබාදෙන ලදී. 2022 වර්ෂයේදී | ප්‍රශස්ථ සේවා මට්ටමක් පවත්වා ගත හැකි පරිදි කාර්යමණ්ඩලය කළමනාකරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | රජය විසින් බඳවා ගැනීම් සීමා කරමින් චක්‍රලේඛ නිකුත් කිරීමෙන් අනතුරුව අත්‍යාවශ්‍ය තනතුරුවලට බඳවා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමට අනුව සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) 06 දෙනෙකු සහ තාක්ෂණික සහකාර තනතුරු 05 ක් සඳහා බඳවා ගැනීම් සිදු කර ඇත. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021-2025 සංයුක්ත සැලැස්මට අනුව විදුලි වාහන බැටරි ආරෝපණ මධ්‍යස්ථාන 90 ක් සංවර්ධනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු මධ්‍යස්ථානයක් ඉදිකර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් පුනර්ජනනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනයට අදාළ කාර්යයන් 3 ක කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ වෙනත් ව්‍යාපෘති කාර්යයන් 24 ක ප්‍රගතිය සියයට 10 සිට සියයට 54 ක වැනි අවම අගයක් වී තිබුණි. | මෙය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. | සංයුක්ත සැලැස්මට අනුව සැලසුම් කල කාර්යයන් කඩිනමින් ඉටු කල යුතුය. |